" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/02(2025) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2025.02. 11 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ අංක: 01/2025

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප.)
ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.)
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (පළාත් පාලන/ අධ්‍යාපන/ සෞඛ්‍ය/ ප්‍රවාහන/ කෘෂිකර්ම)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ ඉංජිනේරු/ සැලසුම්)
ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණන)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණය තුළ අලෙවි සැල් හා එවැනි වැඩසටහන් පැවැත්වීම.**

බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීමේදී 2024.12.17 දින ගත් තීරණ ප්‍රකාරව බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ රාජකාරී කටයුතු සිදු කරන නිලධාරීන්ගේ සුභසාධනය උදෙසා සහ මෙම ගොඩනැගිලි සංකීර්ණයේ පවතින ආයතනයන්හි සුබසාධක සංගම්වල අරමුදල් තර කර ගැනීමට අවස්ථාව ලබා දීම සඳහා බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණයේ බිම් මහලේ (සොබාදම් පියස පෙදෙස) අලෙවිසැල් හෝ එවැනි අරමුදල් උපයන වැඩසටහන් පැවැත්වීම සඳහා මෙතෙක් ලබා දී තිබූ අවස්ථාව එක් මසක් සඳහා වැටුප් දිනය කේන්ද්‍ර කරගත් එක් දිනකට සීමා කරන බව උක්ත මැයෙන් යුත් මගේ අංක CSWP/ADM/18-80/FI/26 හා 2025.01.08 දිනැති ලිපිය මගින් ඔබ වෙත දැනුම් දී ඇත.

02. ඒ අනුව සෑම මසකම වැටුප් දිනයට (මූල්‍ය චක්‍රලේඛ 13/2024 ප්‍රකාරව) පසුව යෙදෙන, සතියේ වැඩ කරන දිනය තුළ මෙම සභා සංකීර්ණයේ බිම් මහලේ (සොබාදම් පියස පෙදෙස) අලෙවිසැල් හෝ එවැනි වැඩසටහන් පැවැත්වීම සඳහා ඇමුණුම 01 හි සඳහන් කොන්දේසිවලට යටත්ව සිදුකළ යුතු අතර ඊට අදාල ඉල්ලීම ඇමුණුම 02 ආකෘති ප්‍රකාරව ඉල්ලුම් කළ යුතුය.

03. ඒ අනුව ඉහත සඳහන් ස්ථානය භාවිත කිරීමේදී ඇමුණුම 01හි සඳහන් කොන්දේසි හා නියමයන් වලට අනුගතව කටයුතු නොකරන සුබසාධක සංගම් වෙත අදාල ස්ථානය භාවිතය සඳහා තවදුරටත් අවසර ලබා නොදීම සිදු විය හැකි අතර ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ගනු ලබනු ඇත.

04. යම් කිසි සුබසාධක සංගමයක් විසින් එහි අරමුදල් තර කර ගැනීමෙන් තොරව පොදු සුබසාධනය අරමුණු කරගත් යම් වැඩසටහනක් පැවැත්වීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක දී ඉහත සඳහන් කර ඇති දිනයන් හැර වෙනත් දිනකයදී ඒ සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබේ.

05. තවද බස්නාහිර පළාත් රාජ්‍ය ආයතන මගින් මෙම කාර්යාල සංකීර්ණයේ බිම් මහළ (සොබාදම් පියස පෙදෙස) තුළ මහජන සුබසිද්ධිය අරමුණු කර ගනිමින් අලෙවි සැල් හෝ එවැනි මුදල් උපයන වැඩසටහන් පැවැත්වීම සඳහා ද ඇමුණුම 01හි සඳහන් අංක IX සිට XIX දක්වා ඇති කොන්දේසි හා නියමයන්ට යටත්ව එහි අංක Iහි සඳහන් A සිට L දක්වා සටහන් කර ඇති මුළු ඉඩ ප්‍රමාණය භාවිතා කිරීම සඳහා අවසර ලබා දීම සිදු කරන අතර තවදුරටත් ඉඩකඩ අවශ්‍ය වේ නම් බිම් මහලේ එළිමහන් වාහන අංගනය භාවිතා කිරීම සඳහා අනුමැතිය ලබා දිය හැකි බවද කාරුණිකව දන්වා සිටිමි.


06. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය හා ඊට අනුබද්ධිත මෙම බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණය තුළ ස්ථාපිත අනෙකුත් ආයතනයන්වල සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.


එස්.එල්.ධම්මිකා කේ. විජයසිංහ
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංකය - 011-2092599
ෆැක්ස් අංකය - 011-2092601
විද්‍යුත් ලිපිනය - chiefsectretary@wpc.gov.lk


පිටපත : ප්‍රධාන ආරක්ෂක නිලධාරී, වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය - කරු.අ.ක.ස. සහ දැ.ගැ.ස.

I. ගොඩනැගිලි සංකීර්ණයේ බිම් මහලේ අලෙවි සැල් හෝ එවැනි අරමුදල් උපයන වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් එක් සුබසාධක සංගමයක් සඳහා අඩි 10x10ක පමණ ඉඩකඩක් ලැබෙන පරිදි, පහතින් A සිට L දක්වා සඳහන් කර ඇති බිම් කොටස් 12 භාවිතා කිරීම සඳහා අවසර දෙනු ලැබේ.




II. එම ස්ථානයේ ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකර ඇති බිත්තියේ සිට අඩි 4ක ඉඩකඩක් ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කරන නිලධාරීන් සඳහා සහ නඩත්තු කළමනාකරණ ඒකකයේ නිලධාරීන්ගේ භාවිතය සඳහා නිදහස් කර, අනුමත කරන ලද ඉඩ කඩ ප්‍රමාණය පමණක් භාවිතා කර අලෙවි සැල් හා එවැනි වැඩසටහන් පැවැත්විය යුතුය. ඒ සඳහා භාවිතා කරන භාණ්ඩ හා සහභාගී වන අනෙකුත් සියළුම පුද්ගලයින් ද භාවිතා කිරීමට අවසර ලබා දෙනු ලබන ඉඩ ප්‍රමාණය පමණක් භාවිතා කරන බවට අවසර ලබා ගන්නා පාර්ශවය විසින් වග බලා ගත යුතුය.

III. සුබසාධක සංගම් මගින් බිම් මහලේ වෙළඳ කුටි හා එවැනි වැඩසටහන් පැවැත්වීම සඳහා අවසර දී ඇති දිනය අයත් මාසයේ පළමු දින සිට අදාල දිනට දින 7කට පෙර දිනය දක්වා (2025 ජනවාරි මස හැර) වෙළඳ කුටි හෝ එවැනි වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් ලිඛිතව ඉල්ලීම් කළ යුතුය අතර එම ඉල්ලීම (ඇමුණුම 02) ඉදිරිපත් කරන අවස්ථාවේදී ම ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශයේ ඊට අදාලව තබා ඇති ලේඛනයේ ද සුබසාධක අංශයේ නිලධාරියෙකු (සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික) විසින් එම ඉල්ලීම හා ඉල්ලුම් කරන බිම් කොටස කුමක්ද යන්න (A,B,C,D... ලෙස ) සහ අදාල සුබසාධක සංගමය මගින් අලෙවි කිරීමට හෝ ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා පිළිබඳව සඳහන් කල යුතුය.

IV. අදාල කටයුතු සඳහා බස්නාහිර පළාත් සභා කාර්යල සංකීර්ණයේ බිම් මහළ ඇතුළත බිම් කොටස් 12ක් පමණක් වෙන් කර ඇති බැවින් එම සියළුම බිම් කොටස් සඳහා ඉල්ලීම් ලැබී ඇති අවස්ථාවක තවදුරටත් ඉඩකඩ වෙන් කර ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් වේ නම් ඒ සඳහා මෙම කාර්යාල සංකීර්ණයේ එළිමහන් වාහන අංගනය තුළ ඉඩකඩ වෙන් කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

V. වෙන් කර ඇති සියළුම බිම් කොටස් (12) සඳහා ඉල්ලීම් නොලද අවස්ථාවක් වේ නම් එම ඉතිරි බිම් කොටස් ද වෙළඳ කුටි හෝ එවැනි වැඩසටහන් පැවැත්වීමට ඉල්ලුම් කල සුබසාධක සංගම් වෙතම ලබාදීම පිළිබඳව සලකා බලන බැවින් යම් සුබසාධක සංගමයක් සඳහා බිම් කොටස් එකකට වඩා අවශ්‍ය වන අවස්ථාවකදී ඒ පිළිබඳව අදාල ඉල්ලීම් ලිපියේම පැහැදිලිව සඳහන් කල යුතුය.

VI. ඉහත V හි සඳහන් පරිදි අතිරේක බිම් කොටස් ලබාදීමේදී ඉල්ලීම් යොමු කර ඇති අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

VII. සුබසාධක සංගම් මගින් අලෙවිසැල් හෝ එවැනි වැඩසටහන් පැවැත්වීම සිදු කරන අවස්ථා වලදී බාහිර පාර්ශව සම්බන්ධ කර ගන්නේ නම් බිම් කුලිය ලෙස එක් බාහිර පාර්ශවයක් වෙතින් රුපියල් 2,500.00ක උපරිමක් දක්වා අයකර ගත හැකි අතර එම මුදල ඉක්මවා බිම් කුලිය සඳහා අයකිරීම් නොකල යුතුය. එසේ මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කර සිදු කිරීමට අදාල සුබසාධක සංගම් වගබලා ගත යුතු අතර උපරිම අගය ඉක්මවා මුදල් අය කිරීමක් පිළිබඳ පැමිණිලි ලැබුණහොත් අදාල සුබසාධක සංගමය වෙත තවදුරටත් වෙළඳකුටි, හෝ එවැනි වැඩසටහන් පැවැත්වීම සඳහා අවසර නොදීමට කටයුතු කරනු ලැබේ.

VIII. බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණයේ රාජකාරී කටයුතු වල නිරත වන නිලධාරීන්ට රාජකාරී කාලය තුළ සුබසාධක සංගම් මගින් පවත්වනු ලබන අලෙවි සැල්, හෝ එවැනි වැඩසටහන් වල කටයුතු කිරීමෙන් වැළකිය යුතු අතර එලෙස රාජකාරී වේලාව තුළ අවිධිමත් ලෙස වෙනත් ආදායම් උත්පාදන කටයුතු වල නිරතවන නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

IX. අලෙවි සැල් තුළ ගුණාත්මක බවින් යුත් භාණ්ඩ/සේවා අලෙවි කරන බවට අලෙවි කුටිය පැවැත්වීම සඳහා අනුමැතිය ලබා ගන්නා සුබසාධක සංගමය/ආයතනය විසින් තහවුරු කර ගත යුතු වන අතර පාරිභෝගිකයින් අගතියට පත්වන යම් අවස්ථාවක් වෙතොත් එම ආයතනය/සුබසාධක සංගමය සෘජුවම මැදිහත් වී අදාල ගැටළුව නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය.

X. අලෙවි සැල් හෝ එවැනි වැඩසටහන් සඳහා අවසර ලබා ගන්නා දින පෙ.ව.6.30 සිට ප.ව.04.00 දක්වා කාලය තුළ දී පමණක් එම ස්ථානය භාවිතා කිරීම සිදු කල යුතු අතර එදින ප.ව.5.30 වන විට උක්ත කටයුතු සඳහා භාවිත කරන ලද සියළුම භාණ්ඩ අදාල පරිශ්‍රයෙන් ඉවත්කර ගත යුතු අතර එම භාණ්ඩ අස්ථානගත වීමක් සම්බන්ධයෙන් වන පැමිණිලි බාරගනු නොලැබේ.

XI. බස්නාහිර පළාත් රාජ්‍ය ආයතන මගින් පවත්වනු ලබන වෙළඳ සැල් හෝ එවැනි මුදල් උපයන වැඩසටහන් සඳහා ඉහත Xහි සඳහන් කාලයට අමතර කාලයක් එම පරිශ්‍රය භාවිතා කිරීමට අවශ්‍ය වන්නේ නම් එම පරිශ්‍රය වෙන් කර ගැනීමට ඉල්ලුම් කරන අවස්ථාවේදී ම ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් කල යුතුය.

XII. අදාල ස්ථානය භාවිතා කිරීමේ දී මහජනතාවට, කාර්ය මණ්ඩලයට, ආරක්ෂක අංශවලට හා පිරිසිදු කිරීමේ සේවාවන්ට බාධාවක් හෝ අවහිරක් නොවන පරිදි භාවිත කල යුතු අතර ගොඩනැගිල්ලේ රාජකාරී කටයුතුවල නිරතවන නිලධාරීන්ට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම සම්බන්ධයෙන් කිසිදු බාධාවක් හෝ අවහිරයක් නොවිය යුතුය. එසේ නොවන බවට අදාල ඉඩකඩ වෙන් කර ගන්නා පාර්ශවය සැමවිටම වගබලා ගත යුතුය.

XIII. අදාල ස්ථානය භාවිතා කරන කාල සීමාව තුළ එහි ඇති දේපළ වලට හානියක් නොවන පරිදි "බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත විවිධ පද්ධති, භාණ්ඩ, උපකරණ හා සවිකිරීම් ඇතුළු උපාංග යථාවත් පරිදි පවත්වාගෙන යාම සම්බන්ධවයි" යන මැයෙන් මා විසින් නිකුත් කර ඇති අංක 03/2023 හා 2023.11.14 දිනැති පාලන චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව කටයුතු කල යුතු ය. ගොඩනැගිලි සංකීර්ණයේ බිම් මහල තුළ ගිනි ගැනීම සඳහා සංවේදී වන විද්‍යුත් උපකරණ ක්‍රියාත්මකව පවතින බැවින් පොල් තෙල් පහන්, ඉටි පන්දම්, හඳුන්කූරු ආදි එම උපකරණ වලට සංවේදී වන ද්‍රව්‍ය දැල්වීමෙන් වැලකිය යුතු අතර එසේ

සිදු කිරීමෙන් සිදුවන හානි හා අපහසුතා සම්බන්ධයෙන් අදාල වෙන්කර ගැනීම සිදු කරන පාර්ශවය වගකිව යුතුය.

XIV. තවද, අදාල ස්ථානය භාවිතා කර එම පරිශ්‍රයෙන් නික්ම යාමට පෙර එහි ඇති දේපල වලට කිසිදු හානියක් සිදුව නොමැති බවට ආරක්ෂක නිලධාරියෙකු මගින් පරික්ෂා කොට තහවුරු කරගත යුතුය.

XV. එසේ ඉඩකඩ භාවිත කිරීමේ දී බස්නාහිර පළාත් සභා කාර්යාල පරිශ්‍රයේ දේපලකට යම් අලාභයන් සිදුවුවහොත්, එම අලාභයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැය වන මුදල අදාල වෙන්කර ගැනීම සිදු කරන පාර්ශවය විසින් ගෙවීම් කල යුතුය.

XVI. වෙන් කර දී ඇති භූමිය හෝ ඒ අවට අපවිත්‍ර නොකල යුතු අතර කාර්යය අවසන් වීමෙන් අනතුරුව නිසි පරිදි අපද්‍රව්‍ය බැහැර කර එම ස්ථානය සම්පූර්ණයෙන් පවිත්‍ර කර පෙර පැවති අයුරින්ම භාරදීම අදාල වෙන්කර ගැනීම සිදු කරන පාර්ශවය සතු වගකීමක් බව අවධාරණය කරමි.

XVII. අදාල වෙළඳ කුටි, හෝ එවැනි වෙනත් වැඩසටහන් පැවැත්වීමට යොදා ගන්නා පුද්ගලයන්ට මත්පැන්, මත්ද්‍රව්‍ය සහ දුම්වැටි භාවිතා කිරීම හාමත්පැන්, මත්ද්‍රව්‍ය සහ දුම්වැටි භාවිතා කර පළාත් සභා පරිශ්‍රය ඇතුළු වීමසම්පූර්ණයෙන් ම තහනම් වේ.

XVIII. වෙන් කරන ලද ඉඩකඩ භාවිතා කිරීමට දෙනු ලබන අවසරය ඕනෑම අවස්ථාවකදී අවලංගු වීමට යටත්ව අදාල අනුමැතින් දෙනු ලැබේ.

XIX. මෙම පරිශ්‍රය තුළ රථ ගාල් කිරීමේ පහසුකම සපයා නොමැති බැවින්, ඒ සඳහා විකල්ප ක්‍රම භාවිතාකල යුතු ය.

Office of the Chief Secretary CSWP/ADM/18-80/FI/26

**<u>බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණයේ බිම් මහලෙ අලෙවිසැල් හෝ අරමුදල් උපයන වැඩසටහන් පැවැත්වීම සඳහා ඉල්ලුම් කිරීම.</u>**

1. සුබසාධක සංගමයේ නම : .................................................................................

.................................................................................

2. ඉල්ලීම සිදුකරන අයගේ නම හා නිලය : .................................................................................

.................................................................................

.................................................................................

3. අලෙවිසැල් හෝ එවැනි වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය වන දිනය : .................................................................................

4.

| | අලෙවි කිරීමට අපේක්ෂිත භාණ්ඩ/සේවා | අදාල අලෙවි කටයුතු සිදු කරනු ලබන ආයතනයේ/ පුද්ගලයාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| i. | | | |
| ii. | | | |
| iii. | | | |
| iv. | | | |
| v. | | | |

5. අමතර බිම් කොටසක් අවශ්‍යද, නැද්ද වග : ඔව් ☐ නැත ☐

අංක ....................... හා .............................. දිනැති චක්‍රලේඛයේ සඳහන් කර ඇති කොන්දේසි වලට යටත්ව බස්නාහිර පළාත් සභා පරිශ්‍රයේ බිම මහළ තුල වෙන් කර ඇති ........ බිම් කොටස භාවිත කිරීමට එකඟවෙමි.

..................................................................... 
නිල මුද්‍රාව(තිබේනම්) හා අත්සන

..................................................
දිනය